# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2008/26 - 2017 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාට පැවරෙන විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 2017.02.22 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද අමරවීර,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

01. රාජ්‍ය අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති යටතේ පහත i, ii, iii, iv, v හා vi යටතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම.
    i. ධීවර තාක්ෂණ විද්‍යාල ඉදිකිරීම.
    ii. ''දියවර සෙවන'' ව්‍යාපෘතිය යටතේ ධීවර ප්‍රජාව වෙනුවෙන් නිවාස ඉදිකිරීම.
    iii. ජාතික ධීවර සමුපකාර ක්‍රමය/ජාතික ධීවර සම්මේලනය ශක්තිමත් ධීවර පදනමක් ලෙස දියුණු කිරීම.

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති*

01. ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2)
02. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂක ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත (1990 අංක 23)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| iv. ධීවර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය/පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (විශේෂයෙන්ම ධීවර ප්‍රජාව සඳහා) | | |
| v. උඩප්පුව, ඩෙල්ෆ්, වලෙයි හා මාදගල් යන ධීවර වරායන් බහුකාර්ය ධීවර වරායන් ලෙස අළුතින් ඉදිකිරීම සඳහා නොමිලේ විස්තරාත්මක නිර්මාණ සැලසුම් සැකසීම | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | |
| vi. ධීවර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා නව ව්‍යාපෘති යෝජනා සැකසීම හා ඒ සඳහා /විදේශීය මූල්‍ය පහසුකම් ලබා ගැනීම එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | | |
| 02. මාදැල් හා හැඹිලි දැල් (ලයිලා, සුරුක්කු, කදන් කෝස්, ලයිට් කෝස්) ආශ්‍රිතව වෙරළබඩ ධීවර කර්මාන්තයේ වර්තමාන ගැටළු සඳහා තිරසාර ප්‍රායෝගික විසඳුම් ලබාදීම සඳහා කටයුතු කිරීම. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 01. ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2) |
| 03. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් යුද්ධයෙන් හා ස්වභාවික ආපදා හේතුකොට ගෙන අවතැන් වී ඇති ධීවර ප්‍රජාව නැවත පදිංචි කිරීම හා කර්මාන්තයට නැවත අවතීර්ණ කරවීම. | | |
| 04. විදේශ රැකියා අමාත්‍යාංශය සමග සම්බන්ධ වෙමින්, කොරියානු ජනරජයේ ධීවර ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා අවශ්‍ය ධීවරයින් පුහුණු කිරීම හා සැපයීම. | | |
| 05. බහුදින ධීවර යාත්‍රාවල දැනට පවතින තත්ත්වයන් වැඩිදියුණු කිරීම හා පසු අස්වනු නාස්තිය අවම කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම. | | |
| 06. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ; | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත (1998 අංක 53) |
| i. මීන් විසිතුරු ප්‍රදර්ශනය වාර්ෂිකව සංවිධානය කිරීම හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ජාත්‍යන්තර තලයකට ගෙනයාමට සහාය වීම. | | |

03 - 746

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.